දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංකඃ 32/2013

මගේ අංකඃඑස්.ඩබ්.ඩී/03/විවිධ/13,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2013.09.26

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**බන්ධනාගාර මාණ්ඩලික නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැළසීම**

උක්ත කරුණ සම්බන්ධව නිකුත් කර ඇති අංකඃ28/2005 හා 18/2006 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලට ඔබගේ අවධානය යොමු කරවමි.

02. 28/2005 දරණ චක්‍රලේඛය මගින් දක්වා ඇත්තේ අවශ්‍ය අවස්ථාවන්හිදී නිවසේ සිට හෝ කාර්යාලයේ සිට රාජකාරි අවශ්‍යතාවයන් සඳහා රථයක් භාවිතා කල හැකි බවය. මෙම රාජකාරි අවශ්‍යතාවයන් මොනවාද යන්න පිළිබඳව දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංකඃ18/2006 මගින් පැහැදිලි කර ඇත.

03. මා විසින් නිකුත් කර ඇති අංකඃ10/2012 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් ලීටර් 120 ක උපරිමයට යටත්ව ඉන්ධන ප්‍රමාණයක් වෙන් කර ඇත්තේ ඉහත අංකඃ18/2006 දරණ චක්‍රලේඛය මගින් දක්වා ඇති රාජකාරි අවශ්‍යතාවයන් වෙනුවෙන් පාවිච්චි කිරීමට පමණක් බැවින් මේ සම්බන්ධව ඔබගේ දැඩි අවධානය යොමු කරන ලෙස දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.